**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 අගෝස්තු 26 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවෙන් අනතුරුව 2012 ජනවාරි 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය ඉවත් කිරීමට තීරණය කර තිබුණි.
මණ්ඩලය ඉවත්කිරීමට ගනු ලැබූ තීරණය ඇතුළුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පදනම් කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපතති කිසිවක් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අවසන් පොත් තොගය ගත් මිල හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගිණුම් තැබිය යුතු වුවත් , ගත් මිලෙන් 20% ක් සහ 50% ක් වට්ටම් යටතේ අලෙවි කරනු ලැබූ ළමා ව්‍යාපෘතියේ පොත් තොගය සහ පිරිවැයෙන් 9% ක වට්ටමකට අලෙවි කරනු ලැබූ සංහිතා 1 හා 11 පොත් තොග රු.5,442,866 ක් වූ පිරිවැයට ගිණුම්ගත කර තිබුණි.

**1.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොත් මිලදී ගැනීම , මුද්‍රණය කිරීම හා අලෙවි කිරීම මණ්ඩලයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය වුවද , අලෙවි කරන ලද පොත්වල පිරිවැය , අලෙවි ආදායම් සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොකර පොත් ගැණුම් හා විකුණුම් ලෙජර් ගිණුම් අතර අවිධිමත්ව ගැලපීම් කර වාර්ෂික මූල්‍ය ප්‍රතිඵලය ගණනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජුනි හා අගෝස්තු මාසයන්හි දී රු. 3,126,393 ක වියදමකින් කාර්යාල පරිශ්‍රය වැඩිදියුණු කිරීම සහ ලී බඩු උපකරණ මිලදී ගැනීම සිදුකර තිබුණද, ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.

### 1.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන "ග්‍රන්ථ උපදේශක මණ්ඩලයේ අනුමත පොත්", "සංහිතා ව්‍යාපෘතිය- II", "ගෘහ පුස්තකාල නාමාවලිය" සහ "කැලෑව ලස්සනයි" යන පොත් තොගයන්හි ගිණුම් අනුව ශේෂය රු.233,812 ක්ද තොග ලේඛන පරිදි ශේෂය රු.450,414 ක්ද වූ අතර වෙනත් පොත් තොග ගිණුම් 05 ක ද එම ශේෂයන් පිළිවෙලින් රු.338,754 ක් සහ රු.253,192 ක් විය. ඒ අනුව එම ශේෂයන් නොසැසදීම හේතුවෙන් ඒවා නිවැරදි බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පාර්ශවයන් දෙකක් වෙත වර්ෂ 1987 - 1997 අතර කාලය තුළ ලබාදී තිබූ රු.166,005 ක් වූ අත්තිකාරම් ශේෂයන් මේ දක්වා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1986 වර්ෂයටත් පෙර සිට නොවෙනස්ව ඉදිරියට එමින් පවතින රු.2,876,614 ක් වූ ශේෂපත්‍රයේ බැරකම් ශේෂ 2 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලංකා බැංකුවේ රු.200,000 ක් වූ ස්ථාවර තැන්පතුවට අදාලව ලැබිය යුතු පොළී ගිණුමේ වසර ගණනාවක සිට ඉදිරියට එමින් පවතින රු.18,521 ක් වූ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය පකාශන්හි දැක්වෙන ළමා පොත් ව්‍යාපෘතිය", "මුද්‍රිත පිටපත් ව්‍යාපෘතිය" ඇතුළු අනෙකුත් පොත් තොගයන්හි රු. 9,092,361 ක් වූ ගිණුම් අනුව වටිනාකම භෞතික සත්‍යාපන වාර්තා සහ උපලේඛන නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2004 ජූලි 29 දිනැති අංක පීඑඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වර්ෂයේ ආරම්භක ශේෂය රු.7,479,886 ක් වූ ස්ථාවර තැන්පතු ආයෝජනයන් සඳහා අමාත්‍යාංශය භාර ඇමතිවරයාගේ හා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 104(1) | වටිනාකම රු. 307,380 ක් වූ හානි වූ පොත් 3595 ක් වසර ගණනාවක් තිස්සේ හානිවීමට ඉඩහැර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු නොකර සම්පූර්ණ ප්‍රමාණයම ආදායමෙන ලියාහැර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 321,381 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව 2010 වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 2,646,830 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,968,211 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා 2010 වර්ෂයේදී රු. 5,000,000 ක් වූ රජයේ ප්‍රදානය 2011 වර්ෂයේදී රු. 5,500,000 ක් දක්වා වැඩිකර තිබුණද පෙර වර්ෂයේ රු. 907,353 ක් වූ පොත් පරිත්‍යාග වියදම් රු. 4,762,094 ක් දක්වා වැඩිවීමත්, විනාශ වූ පොත් වෙනුවෙන් රු. 307,380 ක් ආදායමෙන් කපාහැරීමත් මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චකලේඛ විධිවිධාන ප්‍රකාරව,රු. 1,231,244 ක් ගෙවා මිලදීගන්නා ලද කාර්යාල ලී බඩු ඒකක 59 ක් අංක කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර ඒ තුළ අවශ්‍යතාවය ඉක්මවා රු. 110,595 ක් වටිනා ප්‍රධාන ලිපිකරු මේස 03 ක් සහ පුටු 03 ක් ද ඇතුළත් වී තිබුණි.

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය වෙනුවෙන ප්‍රතිපාදිත රු. 5,500,000 ක් වු මුළු මුදලම ක්‍රියාකාර් සැලැස්ම හා කාර්ය සාධනය ඇගයීමකින් තොරව 2011 අප්‍රේල් 25 දින අමාත්‍යාංශය විසින් මණ්ඩලයේ බැංකු ගිණුමට මුදා හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ සාමාන්‍ය මාසික ලැබීම්, ගෙවීම් හා ඉතිරිය පිළිවෙලින් රු.1,246,760 ක් , රු.662,985 ක් සහ රු.8,066,225 ක් වු අතර වර්ෂය අවසානයේ ඉතිරි මුදල් ශේෂය රු.9,055,585 ක් වී තිබුණි. ඒ අනුව අවශ්‍යතාවයට වඩා විශාල මුදලක් බැංකු ජංගම ගිණුමෙහි නිශ්ක්‍රීයව තබා ගැනීමෙන් පැහැදිලි වන්නේ ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙනු ලබන ප්‍රතපාදන නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන නොමැති බවයි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ආයතන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත් 2011 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 ජුලි 12 දිනදීය.

**4.2 සංයුක්ත සැලැස්ම**

මණ්ඩලය ආරම්භයේ සිට මේ දක්වාම සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.3 **ක්‍රියාකාර් සැලැස්ම**

----------------------

2011 වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 **අභ්‍යන්තර විගණනය**

-------------------------

අදාල රේබිය අමාත්‍යාංශයේ සහාය ඇතිව හෝ අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබණි.

4.5 **අයවැය පාලනය**

--------------------

මණ්ඩලය සතු මුදල් ශේෂයයන් හා රජයේ වාර්ෂික ප්‍රතිපාදනයෙහි එකතුව රු.15,030,142 ක් වූ නමුත්, එම මුදල ඉක්මවා යන ලෙසට රු.23,304,068 ක වටිනාකමකට වියදම් ඇස්තමේන්තුවක් සකස් කර රු.6,757,682 ක් පමණක් වියදම් කර තිබුණි.
සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය පාලන කාරකයක් වශයෙන් අයවැය ලේඛනය යොදා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කරගෙන තිබුණි.

5. **පද්ධති හා පාලන**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) සැලසුම්කරණය හා අයවැය පාලනය
(ඉ) කාර්ය සාධනය